**මිහින්තලේ ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 20 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත ගිණුම්කරන අඩුපාඩු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශුද්ධ වත්කම් හා බැරකම් වල එකතුව අතර රු.1,931,266 ක වෙනසක් පැවතුණි.

(ආ). ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.5,294,253 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ). දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.3,958,710 ක ණය මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඈ). 1990 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය හා සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු රු.321,489 ක් හා වෙනත් වගකීම් රු.138,269 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ). ලැබිය යුතු උසාවි දඩ ආදායම් රු.990,885 ක් හිඟ ආදායම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ). මෝටර් රථ හා කරත්ත වටිනාකම රු.890,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ). ඉකුත් වර්ෂ 03 කට අදාල මුද්දර ගාස්තු ආදායම් එකතුව රු.1,256,728 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු නිශ්චය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ). ප්‍රාදේශීය සභා සඳහා පොදුවේ පිළිගත් ගිණුම් ක්‍රමය අනුව ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය සහ ස්ථාවර වත්කම් ගිණුම්වල ශේෂයන්හි එකතුව එකිනෙකට සමාන විය යුතු වුවත්, රු.810,796 ක වෙනසක් පැවතුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම්

--------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.16,232,305 ක්වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

--------------------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,335,624 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.117,868 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | වරිපනම් බදු | 15 | 42 | 57 |
| (ii). | බදු කුලී | 6,193 | 4,969 | 565 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 1,327 | 1,251 | - |
| (iv). | වෙනත් ආදායම් | 4,750 | 5,555 | 260 |

**2.2.2 වරිපනම් බදු**

1992 අගෝස්තු 05 දිනැති අංක 726/30 දරන ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය මගින් මිහින්තලේ ග්‍රාම නිලධාරි කොට්ඨාශය දියුණු කළ ප්‍රදේශයක් ලෙස නිම කර තිබුණු නමුත්, වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

(අ). පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු උසාවි දඩ ආදායම රු.990,865 ක් විය.

(ආ) 2011දෙසැම්බර් 31 දිනට දක්වා හිඟ මුද්දර ගාස්තු ආදායම රු.1,400,341 ක්වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තුව හඳුනා ගෙන ගිණුම්ගත කර නොතිබුණි

**2.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

සහල්පිටි ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවලිත කිරීමේ අරමුණින් 2008 වර්ෂයේදි වැයකරන ලද රු.565,000 ක වියදම, අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට නොහැකිවීම නිසා නිශ්ඵල වී තිබුණි. මෙම

සම්පත් ප්‍රයෝජනයට ගැනීම සඳහා වන විකල්ප ක්‍රියාමාර්ගයක් කෙරෙහි වගකිවයුතු පාර්ශ්වයන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

**2.4 මෙහෙයුම් අකාර්ක්ෂමතා**

**----------------------------**

ඉදිරි වර්ෂවල ක්‍රියාකාරිත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**03. පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අභ්‍යන්තර පාලනය.

(ඇ). ආදායම් පරිපාලනය.

(ඈ). වත්කම් කළමනාකරණය

(ඉ). ණයගැති හා ණයහිමි පාලනය.